# කසාගල පුරාණ රජමහා විහාරය

ඉංගිරිය සමූහ
කුමාරි ගමගේ



නිදන්වස්තු ආරක්‍ෂා කර ගැනීමට පැරැණි චෛත්‍යය වටකර අලුත් චෛත්‍යය ගොඩනගා ඇති අයුරු

අතීතයේ "කස්සප ලෙන" නමින් හැඳින් වූ " කසාගල පුරාණ රජමහා විහාරය" කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව, මඩගල්ල මාර්ගයේ කුඹුක්ගැටේ නගරයට කිලෝ මීටරයක් පමණ දුරින් රමණීය භූමි භාගයක පිහිටා ඇත.

දේවානම්පියතිස්ස මහ රජතුමාගේ කාලයේ කස්සප නමින් ප්‍රාදේශීය ගොවි නායකයෙක් මෙහි වාසය කර ඇති අතර, ඔහු විසින් මහවනය තුළින් සොයාගනු ලැබූ මෙම ලෙනට "කස්සප ලෙන" යන නම භාවිතා කළ බව පත පොතේ සඳහන් වේ. විශාල ගල් පර්වත දෙකක් මැදිව මෙම විහාරස්ථානය පිහිටා ඇත. මෙහි සියලුම සිතුවම් හා බුදුපිළිම මහනුවර යුගයට අයත් බව සොයාගෙන ඇත. දැනට මෙම විහාරයේ විහාරාධිපතිව වැඩ සිටින්නේ මැල්සිරිපුර විමලරතන ස්වාමීන් වහන්සේය. උන් වහන්සේ පවසන්නේ මෙම විහාරස්ථානය පිළිබඳව මහාවංශයේ සඳහන් වන බවයි. විහාරස්ථානයට පිවිසෙන පියගැට පෙළ ආසන්නයේ සංඝාවාසය පිහිටා ඇත. රහතන් වහන්සේලා ඇතුළු භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් මෙහි වැඩ වාසය කළ බවට සාධක ඇත.

වෙද හාමුදුරුවන් වහන්සේ නමක් මෙහි වැඩ සිටි බවට මෙහි ඇති වසර 500 ට 600 ට වඩා පැරණි බෙහෙත් ඔරු බෙහෙත් ඇඹරු ගල් වලින් සනාථ වේ. විහාරස්ථානයේ මලුවේ විශාල ගල් ඇඳක් හා ය ගල්කණු කීපයක් ද දක්නට ඇත. මහනුවර යුගයට අයත් චිත්‍ර හා සිතුවම් රැසක් දැනට දුර්වර්ණ වී ඇත. ඇතැම් සිතුවම් වල වර්ණ ගැලවී රේඛා සටහන් පමණක් ඉතිරි වී ඇත. අලංකාර නෙළුම්මල් වලින් නිමකර ඇති ගලින් වූ සිතුවම් පතුරු වශයෙන් ගැලවී යාමට පටන්ගෙන ඇත. ඉදිරිපස බිත්තියේ ඇති මකර තොරණ කැඩී බිත්තිය පුපුරා ගොස් ඇති බවත් යම් අන්දමකින් බිත්තිය කඩා වැටීමට ලක්වුවහොත් ඇතුළත සිතුවම් මෙන්ම මකර තොරණද මුලුමනින්ම විනාශ වන බව විහාරාධිපති ස්වාමීන් වහන්සේ පැවසූහ. මකුළු මැටි බදමයෙන් සිතුවම් කර ඇති මෙම චිත්‍ර පතුරු වශයෙන් ගැලවී යන බවත් සියලුම සිතුවම් ක්‍රමි උවදුරට ලක්ව විනාශ වන බවත් උන් වහන්සේ තව දුරටත් පැවසූහ.

දැනට වසර හතකට පමණ පෙර සොරුන් විසින් මෙම විහාරස්ථානය කඩා බිඳ දමා වටිනා බුදුපිළිම හා කරඬු ඇතුලු වටිනා නිධන් වස්තු රාශියක් සොරා ගෙන ගොස් ඇති අතර , මෙතෙක් ඒ පිළිබඳව කිසිම හෝඩුවාවක් සොයා ගැනීමට නොහැකි වී ඇත. ලෙන් විහාරයට ඉහතින් ඇති ගල්තලාව මත ඉදිකර තිබූ, දගැබද නිධන් හොරුන් විසින් කඩා බිඳ දමා එහි තිබූ නිධන් වස්තු පැහැරගෙන ගොස් ඇත. දැනට එහි ඉතිරිව ඇත්තේ පස් ගොඩක් පමණි. මෙම ගල්තලාව මත විශාල පොකුණු දෙකක් දක්නට ඇත. එහි වැඩසිටි රහතන් වහන්සේලා ඇතුළු භික්ෂූන් වහන්සේලා විසින් ස්නානය කිරීමට මෙම පොකුණු භාවිතා කරන්නට ඇති බව පොත්වල සඳහන්ව ඇතැයි විහාරාධිපති හිමියෝ පැවසූහ.



වෙද හාමුදුරුවන් වහන්සේ නමක් වැඩ සිටි බවට දක්වන සාධක - බෙහෙත් ඔරුව සහ බෙහෙත් ඇඹරූ ගල

මෙම විහාරස්ථානය හා එහි ඇති වටිනා බිතුසිතුවම් හා පෞරාණික වස්තූන් ආරක්‍ෂා කර ගැනීමට හැකි අයුරින් කඩිනමින් අදාල බලධාරීන් අවධානය යොමුකළ යුතු බවත්, එයට සියලු සහයෝගය ලබා දීමට විහාරස්ථ දයක පිරිස හා අවට ගම්වාසීන් ඕනෑම අවස්ථාවක සූදානම්ව සිටින බව විහාරාධිපති හිමියෝ පැවසූහ.

ගමයි පන්සලයි බොහෝ දුරස්ව තිබූ පසුගිය කාලයේ ගමත් පන්සලත් සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගම් 18 ක් ආවරණය වන මෙම විහාරස්ථානය මගින් සතිපතා අවට ගම්වල දරුවන් 500 කට වැඩි පිරිසකට දහම් දැනුම ලබා දීමට කටයුතු කර ඇත. එසේම සෑම පෝය දිනකම සිල් සමාදන් කරවීම, භාවනා වැඩසටහන් මගින් අවට ගම්වල සැදැහැවතුන් ගේ සිත්තුල ආගමික හා සදචාරාත්මක ගුණ වගාවන් වැඩි දියුණු කිරීමට උන් වහන්සේ කටයුතු කර ඇත.



අලුත් ලෙන් විහාරයෙහි ඇති බුද්ධ ප්‍රතිමාව



ගල්තලාව මත ඉදිකර ඇති බුදුකුටිය

ලෙන් විහාරයට ඉහතින් ඇති ගල් තලාව මත බුදු කුටියක් ඉදිකිරීම, එම ගල්තලාව මත ඇති ගරාවැටුනු දගැබ හා එහි ඇති විශාල පොකුණු, දැක බලා ගැනීමට , එම ගල්තලාව මතට පිවිසීමට පහසුවන ආකාරයට පඩිපෙළක් ඉදි කිරීමට කටයුතු කර ඇත. විහාරස්ථාන භූමියේ ඇති වටිනා වස්තූන් ආරක්‍ෂා කර ගැනීමට ආරක්‍ෂක වැටක් ද මෑතකදී ඉදිකිරීමට කටයුතු කර ඇත. මේ අයුරින් විහාරස්ථානයේ දියුණුවට මෙන්ම අවට ගම්වල දරු දැරියන්ගේ දහම් දැනුම සදචාරාත්මක ගුණ වගාවන් දියුණු කිරීමට බොහෝ වැඩ කටයුතු රැසක් විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත.